සන්නස
SANNASA

මේ සාක්කිකරුවන් හිටපු කොටි ක්‍රියාකාරීන් වේ. මේ හිටපු ත්‍රස්තයන් 73 කගේ සාක්ෂි මත ඇය ඉහත කී නිලධාරීන්ට එරෙහිව චෝදනා එල්ල කර ඇත්තේ දස වසරකට පසුය. මේ සාක්ෂිවල සත්‍යතාවය තහවුරු කිරීමකින් තොරව ජිනීවා මානව හිමිකම් කවුන්සිලය පිළිගෙන තිබේ.

එහෙත් ජිනීවාහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ඇගේ වාර්තාවට අභියෝග කර නැත.

යස්මින් සූකා මෙලෙස හමුදා සහ පොලිස් නිලධාරීන් 58 කට වධහිංසා චෝදනා එල්ල කරන අවස්ථාවේ කොටි හිතවාදීන්ගේ සමාන්තර රැස්වීම් මෙහෙයවන්නා ලෙස හැඳින්වෙන ඩේවිඩ් වෙහෙලි මුල්වරට ඇගෙන් ප්‍රශ්නයක් අසමින් රජයේ හමුදාවන්ට එරෙහිව සෑමවිට වාර්තා ඉදිරිපත් කරන නුඹ කොටි සංවිධානයට එල්ල වී ඇති චෝදනා ගැන වාර්තා කෙටුම්පත් නොකරන්නේ මන්දැයි විමසීය.

එහෙත් සූකා ඊට ප්‍රතිචාර දුන්නේ නැත. ඇය මානව හිමිකම් කවුන්සිලය තුළදී ශ්‍රී ලංකා හමුදාව ද්‍රවිඩයන් 75000 ක් මරාදැමූ බවට අළුතින් කළ ප්‍රකාශය ගැන නේස්බි සාමිවරයා මෙරටින් පිටව යෑමට පෙර මාහට ලිඛිත ප්‍රකාශයක් කළේය.
ඇගේ මේ චෝදනාව ගැන අපි නේස්බි සාමිවරයාට දැනුම්දුන්නෙමු.





''සූකා වසරක් පාසා මියගිය ද්‍රවිඩයන් සංඛ්‍යාව ඉහල දමනවා. මුලින් ඇය මියගිය ගණන 20000 ක් යයි පැවසුවා. ඉන්පසු එය 40000 ක් යයි කියා සිටියා. දැන් එය 75000 ක් බව කියනවා. 75000 ක් මැරුවා නම් මරපු අය කවුද? ඔවුන්ගේ සිරුරු කොහේද? මින්පසු මට බ්‍රිතාන්‍ය පාර්ලි මේන්තුව තුළ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් නිරීක්ෂණ භටයකු ලෙස කටයුතු කරනවා යයි නේස්බි සාමිවරයා සඳහන් කළේය.

සූකා විසින් මානව හිමිකම් කවුන්සිලය වෙත හිටපු කොටි ත්‍රස්තයන්ගේ සාක්කි මත චෝ දනා එල්ල කර ඇති නිලධාරීන් මෙසේය.

ත්‍රස්ත මර්දන ඒකකය, නිමල් වාකිෂ්ට, අංසග කරන්ට හමුදාව, මේජර් ජනරාල් බො නිපස් පෙරේරා, සුමේධ පෙරේරා පොලිසිය පොලිස් පරීක්ෂක එම්. ඒ ආබ්දීන්, අනුරජිත් සමරවික්‍රම, විජිත බණ්ඩාර, පොලිස් අධිකාරි ප්‍රසන්න අල්විස් පොලිස් පරීක්ෂක ලාල් ගමගේ උප පොලිස් පරීක්ෂක මානවඩු, නියෝජ්‍යපොලිස්පති නන්දන මුරුසිංහ, එම්. ජී. මුතුබණ්ඩා, පොලිස් පරීක්ෂක රාසික් මොහමඩ් හිටපු නියෝජ්‍යපොලිස්පති සිසිර මෙන්ඩිස්හමුදා බුද්ධි අංශය, කේ. කේ. කොඩිතුවක්කු, කපිතන් රසික කොරදාගොඩ අණදෙන නිලධාරි - සුනෙත්, පොලිසිය හිටපු පොලිස්පති එච්. ඒ. වික්‍රමරත්න, විශේෂ විමර්ශන ඒකකය මහිල් ඩොලේ, ත්‍රස්ත මර්දන පොලිස් පරීක්ෂක සමන් කරුණාරත්න, එම්. ජනකාන්ත, උප පරීක්ෂක හේමචන්ද්‍ර, ගංගානාථ, විජිත බණ්ඩාර, අනුරජිත් සමරවික්‍රම වව්නියා ජෝශප් හමුදා කඳවුර - හිටපු අණදෙන නිලධාරි සුනෙත් මෙලෙස ආරක්ෂක හමුදා නිලධාරීන් 58 කට වධක චෝදනා එල්ල වෙද්දී රජය ඊට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ගයක් නැත.

මෙය පුදුමයක් නොවේ. කොටි මිනීමරුවාවූ වේළුපිල්ලේ ප්‍රභාකරන්ගේ විශාල ප්‍රමාණයේ කාඩ්බෝඩ් රුවක් ජිනීවා මානව හිමිකම් මූලස්ථානය ඉදිරියේ ප්‍රදර්ශනය වේ. මේ ගැන මානව හිමිකම් කොමසාරිස් මිචෙලි බැචලට් ලැජ්ජා විය යුතු නොවේද? හිටපු අගමැති රජිව් ගාන්ධි හිටපු ජනපති ආර්. ප්‍රේමදාස සහ හිටපු විදේශ ඇමැති කදිරගාමර් ඇතුළු පොලිස් භටයින් 600 ඝාතනය කළ ප්‍රභාකරන් සමූල ඝාතකයාගේ රුව මානව හිමිකම් මූලස්ථානය ඉදිරියේ ප්‍රදර්ශනය කිරීම සඳහා කොටි ඩයස්පෝරාවට අවසර දී ඇත්තේ ජිනීවා පොලිසියයි.

මේ අන්දමට ජිනීවා නගර බලධාරීන් අල්කයිදා නායක බින් ලාඩන්ගේ රුවක් ජිනීවාහි ප්‍රදර්ශනය කිරීමට ඉඩදෙන්නේ නැත.

එසේම කොටි ඩයස්පෝරාව ජිනීවා මානව හිමිකම් මූලස්ථානය ඉදිරියේ ඇති පාදතුනේ පුටුවටද සමච්චල් කර ඇත. කොටි තැබූ බිම්බෝම්බ නිසා විශාල පිරිසකට පාද අහිමි විය. බිම් බෝම්බ වලට ගොදුරු වූවන් සංකේතවත් කරමින් මෙම පාද තුනේ පුටුව ඉදිවී තිබේ. එසේ නම් එම පුටුව ඉදිරියේ උද්ඝෝෂණ පවත්වන්නේ බිම් බෝම්බ තැබූ කොටි මිනීමරුවන් නොවේද?

එසේ වූවත් ස්විස් මාධ්‍ය සහ දේශපාලකයන් පවා මේ සැබෑ යථාර්ථය තේරුම් ගෙන නැත. ශ්‍රී ලංකාවේදී බිම් බෝම්බ තැබූ අපරාධකරුවන් යුද අපරාධකරුවන් බව සනාථ වී තිබියදී ඔවුන්ට මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ ප්‍රදර්ශන පැවැත්වීමට ඉඩදීම අපරාධ අනුමත කිරීමකි.

ස්විස් රජයේ මේ දීන ක්‍රියාකලාපය දැඩි අවධානයට ලක්විය යුත්තේ ප්‍රභාකරන් ඝාතකයා නිදහස වෙනුවෙන් සටන් කළ අයකු වී හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග හිටපු ජනපති මහින්ද රාජපක්ෂ, හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජප ක්ෂ, හිටපු හමුදපති සරත් ෆොන්සේකා, වත්මන් ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන, යුද අපරාධකරුවන් ලෙස හඳුන්වා ඡායාරූප ජිනීවා මානව හිමිකම් කවුන්සලය හමුවේ ඔවුන්ගේ ඡායාරූප ප්‍රදර්ශනය කිරීමට ඉඩදීමයි. මේ අතර යහපාලන රජයේ සහ වත්මන් රජයේ සංහිඳියා ක්‍රියාමාර්ගයට මුලතිව්හි ද්‍රවිඩ පිරිස් අතුල් ප්‍රහාරයක් එල්ල කළහ. ඒ මේධාලංකාර හිමියන්ගේ ආදාහන කටයුතු සිදුකිරීම වියාර්ථ කිරීමට උත්සාහ කිරීමයි. එහිදී මුලතිව් පොලිසිය දීන මෙ හෙයුමක නිරත වී ඇත. මුලතිව් පොලිසිය මුලතිව් වෙත පැමිණි භික්ෂූන් වහන්සේලා සහ ගිහියන්ද ඡායාරූප ගතකිරීමේ යෙදී තිබේ. ආරංචි මාර්ග දක්වන අන්දමට මුලතිව් පන්සල අසලට ද්‍රවිඩ සන්ධාන මන්ත්‍රිනී ශාන්තිනි ස්කන්ධරාජා, හිටපු පලාත් සභා මන්ත්‍රී රවිහරන් සහ යාපනය විශ්ව විද්‍යාල සිසුන් පිරිසක්ද පැමිණ තිබේ. එහිදී විග්නේෂ්වරන් පැවසුවේ මේධාලංකාර හිමිගේ ආදාහනය ද්‍රවිඩ නිජබිමේ සිදුකිරීම වැරදි බවයි.

මෙයට පෙර උතුරේ කොටි හිතවාදීහු නාගදීපයේ නාහිමියන්ගේ ආදාහන කටයුතු උතුරේ සිදුකිරීම වියාර්ථ කිරීමට දැරූ උත්සාහය අසාර්ථක විය. මින් වියාජ සංහිඳියාවේ වත්මන් තත්ත්වය සනාථ වනු ඇත.

මෙවන් අවාසනාවන්ත තත්ත්වයක් මැද පසුගිය සැප්තැම්බර් 16 දා උතුරේ පැවැත්වූ එළඟු තමිල් නමැති විග්නේෂ්වරන්ගේ මෙ හෙයුමේ යයි අරමුණු හෙළිවිය. මෙය ප්‍රභාක රන්ගේ පොංගු තමිල් උළෙලට සමානය.

එහිදී ඉදිරිපත් වූ ඉල්ලීම් මෙසේයි.

- ද්‍රවිඩ නිජබිම තුළ සිංහල ජනාවාස ඇති නොකරනු
- යුද අපරාධකරුවන්ට නඩු පවරනු
- හිටපු කොටි නිදහස් කරනු (කොටි මිනීමරුවන්)
- අතුරුදන්වූවන් ගැන ජාත්‍යන්තර පරීක්ෂණයක් පවත්වනු
- ද්‍රවිඩ ප්‍රදේශ හමුදාකරණය නොකරනු
- ද්‍රවිඩ සටන්කාමීන් ත්‍රස්තවාදීන් ලෙස හැඳින්වීමෙන් වැළකීමට ජාත්‍යන්තර ප්‍රජාව ක්‍රියාකළ යුතුයි
- සිංහල සහ මුස්ලිම් ජනතාව ස්වයං පාලනය සඳහා ද්‍රවිඩයන්ට ඇති හිමිකම පිලිගනු
- ද්‍රවිඩ සමූල ඝාතනය ගැන අන්තර්ජාතික පරීක්ෂණයක් පවත්වනු
- ත්‍රස්ත මර්දන පණත අහෝසි කරනු
- ස්වයං පාලනය ලබාගැනීමට ජනමත විචාරණයක් පවත්වනු

මේ බෙදුම්වාදී ඉල්ලීම්වල ප්‍රධාන න්‍යායචාර්යවරයා කොළඹ කුරුඳුවත්තේ සිට උතුරට ගිය සී විග්නේෂ්වරන්ය.




ප්‍රභාකරන්ට එරෙහිව පුද්ගලික හේතූන් මත යයි දක්වමින් නඩුවක් විභාග කිරීම ප්‍රතික් ෂේප කළේද විග්නේෂ්වරන් බව සිහිපත් කළ යුතුය.

විග්නේෂ්වරන්ගේ උතුරේ පැවැති එළඟු තමිල් රැස්වීමේදී ඔහු සිය දේශනය අවසාන කළේ ද්‍රවිඩයිනි නැගිටිනු ද්‍රවිඩයන් දිගු කලක් දිනේවා යනුවෙන් පවසමිනි.

එදා ප්‍රභාකරන් ක්‍රියාකළේද මෙවන් පිළි වෙතකි. විග්නේෂ්වරන්ගේ මේ රැස්වීමට කිලිනොච්චි ද්‍රවිඩ සන්ධාන මන්ත්‍රී එස් ශ්‍රීධර න් හිටපු පළාත් සභා ඇමැති ඉයන්හරනේස න් සුරේන් ප්‍රේමචන්ද්‍රන් සහ ඔහුගේ සොහොයුරා කන්දයියා සරමේස්වරන්ද සහභාගිවී ඇත. එසේම කතෝලික පූජක වරු දෙදෙනකුද ඊට සහභාගි වී තිබේ.

එසේ වූවත් රජය මේ සිදුවන්නේ කුමක්ද යන්න අවබෝධකරගෙන තිබේද?

විග්නේෂ්වරන්ගේ මේ එළඟු තමිල් යනු බෙදුම්වාදයේ අංක 2 මෙහෙයුමයි.

මේ අතර පසුගිය සඳුදා කොළඹ පැවැති ගෝඨාභය නමින්වූ රචිත ග්‍රන්ථය එළිදැ ක්වීමේ උත්සවයේදී මේජර් ජනරාල් කමල් ගුණරත්න අවසාන සාම ගිවිසුම් සමයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පැවැති අවාසනාවන්ත තත්ත්වය අනාවරණය කළේය.

පියාසර කළ හැකි එකම ප්‍රහාරක යානාව ක්වත් අපට තිබුණේ නැහැ. හිටපු ගුවන් හමුදාපති රොශාන් ගුණතිලක ඊට සාක්ෂි දරනවා. හමුදාව ඉතිහාසයේ බරපතලම නින්දා සහ අවමන් සහගත තත්ත්වයට ලක්වූයේ මේ සාමය සමයේයි යයි හෙතෙම ඊනියා සටන්විරාම ගිවසුමේ පසුබිම හෙලික රවීම කියා සිටියේය.

ගුවන් හමුදාව සතුව මිග් යානා හතරක් තිබුණා. ඒවා ගුවන් ගත කිරීමට නොහැකිවුණා. එහෙත් එම යානා නැවත අළුත්වැඩියා කර යුද්ධයට යොදවා ගනු ලැබුවා යයි ඔහු තවදුරටත් පළකළේය.

මේජර් ජනරාල් කමල් ගුණරත්න කලකට පෙර යටපත්වී තිබූ තවත් තොරතුරක් හෙළිකළේය.

ඒ ඔහු නාගර්කෝවිල් හමුදා කඳවුරේ අණදෙන නිලධාරියාව සිටියදී එවකට හමුදාපති වූ ලයනල් වැනල් සහ අමාත්‍ය මිලින්ද මොරගොඩ කඳවුර වෙත පැමිණි කොටි පරාජය කිරීමට නොහැකි බවත් නාගර්කෝවිල් කඳවුර ඉවත් කළ යුතු යයි පැවසූ බවයි.

තමා නාගර්කෝවිල් කඳවුර ඉවත් කිරීමට එරෙහිවූ බවද මේජර් ජනරාල්වරයා අනා වරණය කළේය.

මෙම අතීතය ජනතාව නොදනී. අද පාත්පයි න්ඩර් වැනි ආයතන පිහිටුවාගෙන රටේ ආරක්ෂාව ගැන හඬ නගන්නේ මෙවැනි මොරගොඩ වැන්නවුන්ය.

මේ අතර මෙරට මානව හිමිකම් කොමිසම පොලිසියට සහ හමුදාවට උපදෙස් දීමට ඉදිරිපත් වී ඇත. වන්නි මෙහෙයුම දියත් වූයේ මානව හිමිකම් කොමිසමේ සභාතිනි දීපිකා උඩගමගේ උපදෙස් මත නොවේ.

ඇය පසුගියදා පොලිසියට උපදෙස් දෙමින් පැවසුවේ සාක්ෂි තහවුරු කර ත්‍රස්තවාදී සැකකරුවන් අත්අඩංගුවට ගන්නා ලෙස ඇගේ මෙම අපූරු උපදෙස් අනුව ත්‍රස්තවාදි ක්‍රියාවලට සම්බන්ධවූවන් අත්අඩංගුවට ගත යුත්තේ කවදාහෝ සාක්කි ලැබෙන තුරු බලාසිටීමෙන්ද?

ඇය මේ සතියේදී වැඩබලන පොලිස්ප ති වෙත පැවසුවේ ඇතැම් පිරිස් කරන වෛරය උපදවන ප්‍රකාශ ගැන පොලිසිය ක්‍රියානොකරන බවට වාර්තා වීම නිසා ඒ ගැන ක්‍රියාකරන ලෙසයි.

**කීර්ති වර්ණකුලසූරිය**

පසුගියදා මෙරටට පැමිණි එක්සත් ජාතීන්ගේ නියෝජිත අහ්මද් නැමැත්තාද වෛරය උපදවන ප්‍රකාශ කරන පාර්ශ වවලට එරෙහිව පොලිසිය ක්‍රියා නොකිරීම ගැන පොලිසියට චෝදනා කර තිබුණි.

33 වන පිටට